# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1992/78 - 2016 නොවැම්බර් මස 11 වැනි සිකුරාදා - 2016.11.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී - 1/2003

**2002 අංක 25 දරන සාපරාධී කරුණුවල දී අන්‍යොන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත**

2 වන වගන්තිය යටතේ නියමය

2002 අංක 25 දරන සාපරාධී කරුණුවල දී අන්‍යොන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ, 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මම, මේ නියමය මගින් ඉහත කී පනතේ විධිවිධාන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ යුක්රේනයේ ආණ්ඩුව අතර, දෙදහස් දහසයේ ජුනි මස විසි පස් වන දින කිව් හි දී ඇතිකර ගනු ලැබූ ගිවිසුම සම්බන්ධයෙන් අදාළ වන බවට ප්‍රකාශයට පත් කරමි. ශ්‍රී ලංකා ආණ්ඩුව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය රටක් නොවන යුක්රේන ආණ්ඩුව අතර ඇති කරගනු ලැබූ මෙම ගිවිසුම සාපරාධී කරුණුවල දී අන්‍යොන්‍ය නෛතික සහයෝගය ලබාදීම සම්බන්ධයෙන් අදාළ වන අතර එය වෙනත් කරුණු අතර, ඔවුන්ගේ අදාළ අධිකරණ බලසීමා තුළ ත්‍රස්තවාදය ඇතුළු අපරාධවලට එරෙහිව කටයුතු කිරීම සම්බන්ධයෙන් ගිවිසුමට අදාළ පාර්ශවයන් දෙක විසින් නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ඵලදායී බව සහයෝගීතාව තුළින් වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ද අදාළ වේ.

විජයදාස රාජපක්ෂ,
අධිකරණ අමාත්‍ය.

2016 නොවැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

1A - PG 3230 — 407 (2016/11)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*